# ILO C188 – 2007, ධීවර කර්මාන්තය හා සම්බන්ධ රැකියා සම්මුතිය ස්ථිර කිරීම සඳහා ශ්‍රී ලංකාව ධනාත්මක පියවර ගනී:

# කෙටුම්පත් නියෝග මාලාව ධීවර අමාත්‍යවරයා සහ කම්කරු අමාත්‍යවරයා වෙත පිළිගන්වන ලදී.

## ILO හි තාක්ෂණික සහාය ඇතිව DFAT සහ නෝර්වේ රජයේ අරමුදල් සහයෙන් සකස් කරන ලදී.

---

කොළඹ (ILO පුවත්)

අද දින, 2023 දෙසැම්බර් 08 කොළඹ නගරයේදී, ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රයෙහි සුනිසි ලෙස සේවා කාර්යයන් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය උනන්දුව තවදුරටත් ඉදිරියට ගෙන යමින්, ILO C188 – 2007, ධීවර කර්මාන්තය හා සම්බන්ධ රැකියා සම්මුතියට අදාළ කෙටුම්පත් නියෝග මාලාව ගරු ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්දා මහතාට, ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතාට, ගරු ධීවර රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත මහතාට, ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් පෝල් ස්ටීවන්ස් මහතාට සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂිකා සිම්රින් සිං මහත්මියට පිරිනමන ලදී.

මෙහිදී අර්ථාන්විත සංවාද සහ සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, C188 පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලදී. ගෝලීය වශයෙන්, ධීවර කර්මාන්තය මේ වනවිට වඩාත් අවදානම් සහිත රැකියා අතරින් එකක් වේ. ILO විසින් හඳුන්වා දෙන ලද ජාත්‍යන්තර ගිවිසුමක් වන C188, ලොව පුරා ධීවර කර්මාන්තයෙහි නියැලී සිටින අයට සුනිසි සේවා කොන්දේසි සහතික කිරීම අරමුණු කරගත් නිර්ණායක සහ නිර්දේශ සකස් කර තිබේ. එය ධීවර ක්ෂේත්‍රයේ විවිධ අංශ, එනම්, වැඩ කරන වේලාවන්, ධීවර වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යය, යාත්‍රාවල ජීවන තත්ත්වයන් ඇතුළු අනෙකුත් අංශවලට අවධානය යොමු කර ඇත.

ශ්‍රී ලංකාව තුල ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය, වෙළඳාම, රැකියා සහ අපනයන ඉපැයීම් සඳහා ධීවර අංශය වැදගත් දායකත්වයක් සපයයි. පවතින ආර්ථික අර්බුදයෙන් වඩාත් බලපෑමට ලක් වූ ක්ෂේත්‍ර අතර ධීවර ක්ෂේත්‍රය ද වේ. රටේ ධීවර ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමට සහ සුනිසි සේවා තත්ත්වයන් වැඩිදියුණු කිරීමට රජයේ කැපවීම සනිටුහන් කරමින්, C188 සම්මුතිය ස්ථිර කිරීම සඳහා, කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ධීවර අමාත්‍යාංශය විසින් ඒකාබද්ධ කැබිනට් පත්‍රිකාවක් සැකසීම සඳහා අද දින පිරිනමන ලද කෙටුම්පත් නියෝග මාලාව ප්‍රධාන ලියවිල්ලක් ලෙස ක්‍රියා කරනු ඇත.

එම වැඩසටහනයෙහි අදහස් දැක්වූ ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා C188 සම්මුතිය ස්ථිර කිරීම සම්බන්ධයෙන් තම සහයෝගය පලකල අතර, " ධීවරයන්ට රැකියාවේ ගෞරවය ලබා දීම නීතිමය වගකීමක් පමණක් නොව, සදාචාරාත්මක යුතුකමක් වන අතර, ධීවරයන් ඇතුළු ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා වඩාත් ශක්තිමත් සමාජ ආරක්ෂණ පද්ධතියක් නිර්මාණය කිරීම අමාත්‍යාංශයේ වැදගත් කටයුත්තක් බව" පවසන ලදී.

ගරු ධීවර අමාත්‍යවරයා සියලු හවුල්කරුවන්ගේ සහයෝගය ඇතිව මෙම සම්මුතිය ශ්‍රී ලංකාව විසින් ස්ථිර කිරීම කෙරෙහි තම විශ්වාසය පළ කරමින්, ‘‘ධීවරයන්ට, ඔවුන්ට ලැබිය යුතු අයිතිවාසිකම් සහ ආරක්ෂාව ලබා දිය යුතු බවද, ධීවර කටයුතු සඳහා වන සුනිසි වැඩ න්‍යාය පත්‍රය අමාත්‍යාංශය සම්පූර්ණයෙන්ම පිළිගන්නා බව’’ද ප්‍රකාශ කළේය.

C188 ස්ථිර කිරීම සහ ඒ අනුව ක්‍රියා කිරීම මඟින් ධීවරයන්ගේ සේවා තත්ත්වය වැඩිදියුණු කිරීම, අමතර රැකියා උත්පාදනය සහ ශ්‍රම රඳවා තබා ගැනීම සඳහා පහසුකම් සැලසීම පමණක් නොව, ක්ෂේත්‍රයේ ගෝලීය තරඟකාරිත්වය ඉහළ නංවමින් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමෙන් තිරසාර ප්‍රතිලාභ ලබාගත හැකි අතර, එය රටේ ධීවර අංශයේ දිගුකාලීන වර්ධනයට සහ තිරසාරභාවයට මූලික අඩිතාලම ද සකස් කරයි.

‘‘සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ ආර්ථික සංවර්ධනය සඳහා ඇති අවස්ථා වැඩි දියුණු කිරීම ඕස්ට්‍රේලියානු රජය විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන සංවර්ධන සහයෝගයෙහි වැදගත් කොටසක් වේ. මෙරට සංවර්ධනය සඳහා ධීවර ක්ෂේත්‍රය විශේෂ වැදගත්කමක් දරන අතර, නිල් කකුළුවන්, ඉස්සන්, සහ මුහුදු කූඩැල්ලන් වැනි ක්ෂේත්‍ර වල ආයෝජනය, ඉහල ප්‍රතිලාභ ලබා දෙන සහ ජීවන තත්වය ඉහල නංවන අංශ වේ. C188 සම්මුතිය ස්ථිර කිරීම සඳහා රජය සිය ගමන ඉදිරියට ගෙන යනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු,’’ ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් පෝල් ස්ටීවන්ස් මහතා පැවසීය.

මෙම වැඩසටහන මගින් C188 සම්මුතිය ස්ථිර කිරීමේ ඉදිරි පියවර පිලිබඳව අදහස් ලබා දෙන ලද අතර, C188 සම්මුතිය පාදක කරගනිමින් සැකසූ කෙටුම්පත් නියෝග මාලාව පිලිබඳව ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවකරුවන් සිය අදහස් ප්‍රකාශ කරන ලදී.

සම්මුතියේ වැදගත්කම අවධාරණය කරමින්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන කාර්යාලයේ අධ්‍යක්ෂිකා සිම්රින් සිං මහත්මිය පැවසුවේ, ‘‘ශ්‍රී ලංකාව සිය ආර්ථිකය නගාසිටුවීම සඳහා ක්‍රියා කරන මෙම අවස්ථාවේදී C188 සම්මුතිය ස්ථිර කිරීමෙන් ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගේ ගෞරවය සහ ආරක්ෂාව ශක්තිමත් කෙරෙන අතර, එය ධීවර ක්ෂේත්‍රයේ සංවර්ධනයටද උපකාර වේ. C188 සම්මුතිය ස්ථිර කිරීම සඳහා ධීවර අමාත්‍යාංශයේ සහ කම්කරු අමාත්‍යාංශයේ උනන්දුව අපව තවදුරටත් දිරිමත් කරන අතර, C188 සම්මුතිය ස්ථිර කිරීම සම්බන්දයෙන් වූ ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන්ට ILO අඛණ්ඩව සහය දෙන‘’ බවයි.

ILO හි තාක්ෂණික හා සම්බන්ධීකරණ සහයෝගය ඇතිව, ධීවර අමාත්‍යාංශය, කම්කරු අමාත්‍යාංශය සමඟ එක්ව ශ්‍රී ලංකාව තුල LO C188 – 2007, ධීවර කර්මාන්තය හා සම්බන්ධ රැකියා සම්මුතිය ස්ථිර කිරීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රගතිගාමී පියවර ගෙන ඇත.s

*Local Empowerment through Economic Development and Reconciliation (LEED+) ව්‍යාපෘතිය ජාත්‍යන්තර කම්කරු සංවිධානයෙහි Global Jobs for Peace and Resilience නම් වැඩසටහනෙහි*

International Labour Organization

*අංශයක් වන අතර, ඕස්ට්‍රේලියානු රජයේ විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව (DFAT) සහ නෝර්වේ රජය විසින් එයට සහාය දක්වයි.*

*ජාත්‍යන්තර කම්කරු සංවිධානය යනු වැඩලෝකය සඳහා වන එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනය යි. ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සම්පාදනය, තාක්ෂණික සහාය ලබා දීම, මෙන්ම සේවා නියුක්තිය, කම්කරු අයිතිවාසිකම් සහ සමාජ ආරක්ෂණය සම්බන්ධයෙන් වන තීරණාත්මක ගැටළු විසඳීම සඳහා ප්‍රතිපත්තිමය සංවාදයන්ට එළැඹීමට කටයුතු කරයි. ලොව පුරා සමාජ සාධාරණත්වය වර්ධනය කිරීමේ සහ සුනිසි රැකියා ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවර සාක්ෂාත් කිරීම සඳහා, රජයන්, සේවා යෝජක හා සේවක සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමග සමීපව කටයුතු කරයි.*